# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2174/3 - 2020 මැයි මස 05 වැනි අඟහරුවාදා - 2020.05.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ඓතිහාසික ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රාජමහා විහාරයට අයත් පූජනීය ප්‍රදේශය, පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 2153/12 හා 2019 දෙසැම්බර් මස 10 වැනි අඟහරුවාදා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2153/12 - 2019 දෙසැම්බර් මස 10 වැනි අඟහරුවාදා ප්‍රසිද්ධ කරන ලද *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා හට පැවරී ඇති පූජා භූමි සංරක්ෂණය හා සංවර්ධනය කිරීම විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය, "**ඓතිහාසික ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රාජමහා විහාර පූජාභූමිය**" යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය.

2020 මැයි මස 04 වැනි දින,
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

*උපලේඛනය*

**ඓතිහාසික ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රාජමහා විහාර පූජාභූමිය සංයුක්ත වන ප්‍රදේශය**

සර්වේ ජනරාල්ගේ 2016 නොවැම්බර් 04 වැනි දින සහ අංක KA/HRN/16/536 දරන අනුරේඛනයේ නිරූපිත බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔලබොඩුව, තලගල සහ කහටපිටිය ග්‍රාමවල පිහිටි හෙක්ටයාර් 4.8128ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කැබලි අංක A : මාර්ගය
කැබලි අංක B : මාර්ගය

කැබලි අංක C

*උතුරට* : එන්. ඩී. එස්. අප්පුහාමි හිමිකම් කියන කුරුදුවත්තෙ ඕවිට, එච්. එම්. ප්‍රනාන්දු හිමිකම් කියන ආචාරියා කුඹුර ;
*නැගෙනහිරට* : එච්. එම්. ප්‍රනාන්දු හිමිකම් කියන ආචාරියා කුඹුර ;
*දකුණට* : කැබලි අංක B සහ එන්. ඩී. එස්. අප්පුහාමි හිමිකම් කියන කුරුදුවත්තෙ ඕවිට ;
*බටහිරට* : එන්. ඩී. එස්. අප්පුහාමි හිමිකම් කියන කුරුදුවත්තෙ ඕවිට.

කැබලි අංක D

*උතුරට* : එච්. එම්. ප්‍රනාන්දු හිමිකම් කියන ආචාරියා කුඹුර, කනත්තේ දියෝනිස් සහ එම්. ඩී. කරුණාවතී හිමිකම් කියන කෝරලයා කුඹුරේ ඕවිට ;
*නැගෙනහිරට* : කනත්තේ දියෝනිස් සහ එම්. ඩී. කරුණාවතී හිමිකම් කියන කෝරලයා කුඹුරේ ඕවිට සහ කේ. සී. ප්‍රියනාත් හිමිකම් කියන කරයාල් කුඹුරේ තුනෙන් පංගුව ;
*දකුණට* : කේ. සී. ප්‍රියනාත් හිමිකම් කියන කරයාල් කුඹුරේ තුනෙන් පංගුව සහ කැබලි අංක B ;
*බටහිරට* : කැබලි අංක B සහ එච්. එම්. ප්‍රනාන්දු හිමිකම් කියන ආචාරියා කුඹුර.

කැබලි අංක E

*උතුරට* : එස්. කෝට්ටෙගොඩ හිමිකම් කියන කුරුදුවත්තෙ ඕවිට සහ කැබලි අංක B ;
*නැගෙනහිරට* : කැබලි අංක B ;
*දකුණට* : කැබලි අංක B සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ;
*බටහිරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) එස්. කෝට්ටෙගොඩ හිමිකම් කියන කුරුදුවත්ත ඕවිට සහ කැබලි අංක B

කැබලි අංක F

*උතුරට* : කේ. සී. ප්‍රියනාත් හිමිකම් කියන කරයාල් කුඹුරේ තුනෙන් පංගුව සහ ඩබ්ලිව්. පී. කුමාරසිරි හිමිකම් කියන රංකෙතවත්ත ;
*නැගෙනහිරට* : ඩබ්ලිව්. පී. කුමාරසිරි හිමිකම් කියන රංකෙතවත්ත සහ හිමිකරු සහ ඉඩමේ නම සොයාගත නොහැකි කුඹුර ;
*දකුණට* : හිමිකරු සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම, ජී. ඩී. අයි. මල්කාන්ති පෙරේරා හිමිකම් කියන ගංගොඩ විලගේ මහවත්ත, කැබලි අංක G සහ B ;
*බටහිරට* : කැබලි අංක G සහ B

කැබලි අංක G

*උතුරට* : කැබලි අංක B සහ F ;
*නැගෙනහිරට* : කැබලි අංක F හිමිකරු සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම සහ ජී. ඩී. අයි. මල්කාන්ති පෙරේරා හිමිකම් කියන ගංගොඩවිලගේ මහවත්ත ;
*දකුණට* : ජී. ඩී. අයි. මල්කාන්ති පෙරේරා හිමිකම් කියන ගංගොඩවිලගේ මහවත්ත ;
*බටහිරට* : කැබලි අංක B

කැබලි අංක H

*උතුරට* : දෙපා ඇළ සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ;
*නැගෙනහිරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ;
*දකුණට* : තරංග අනුෂ්ක කුමාර හිමිකම් කියන පිටිවල කුඹුර සහ හේවගේ උපුල් හිමිකම් කියන කොලයින් කුඹුර ;
*බටහිරට* : තරංග අනුෂ්ක කුමාර හිමිකම් කියන පිටිවල කුඹුර සහ හේවගේ උපුල් හිමිකම් කියන කොලයින් කුඹුර සහ දෙපා ඇළ.

කැබලි අංක J

| | | |
|---|---|---|
| *උතුරට* | : | අඩිපාර, තරංග අනුෂ්ක කුමාර හිමිකම් කියන පිටවල කුඹුර සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ; |
| *නැගෙනහිරට* | : | මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) කේ. බී. ප්‍රේමසිරි හිමිකම් කියන කහටගහවත්ත සහ දයාරත්න ගමගේ හිමිකම් කියන බෝගහඹිවිට ; |
| *දකුණට* | : | කේ. බී. ප්‍රේමසිරි හිමිකම් කියන කහටගහවත්ත සහ දයාරත්න ගමගේ හිමිකම් කියන බෝගහඹිවිට, කුමාරසිංහ, කාවින්ද ජයකොඩි සහ ප්‍රේමවතී කල්දේරා හිමිකම් කියන පිටවල කුඹුර ; |
| *බටහිරට* | : | කුමාරසිංහ, කාවින්ද ජයකොඩි සහ ප්‍රේමවතී කල්දේරා හිමිකම් කියන පිටවල කුඹුර, දෙපා ඇළ සහ අඩිපාර |

කැබලි අංක K

| | | |
|---|---|---|
| *උතුරට* | : | එන්. ඩී. සිරිසේන හිමිකම් කියන අළුබෝගහඹිවිටේ කුඹුර ; |
| *නැගෙනහිරට* | : | එන්. ඩී. සිරිසේන හිමිකම් කියන අළුබෝගහඹිවිටේ කුඹුර, අඩිපාර සහ දෙපා ඇළ ; |
| *දකුණට* | : | අඩිපාර, දෙපා ඇළ, නාමගේ නිමල් හිමිකම් කියන එගොඩඹිවිට කුඹුර සහ ඩී. නවරත්න හිමිකම් කියන වැලිපිල්ලෑව ; |
| *බටහිරට* | : | ඩී. නවරත්න හිමිකම් කියන වැලිපිල්ලෑව. |

කැබලි අංක M

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය සහ ශ්‍රියාලතා ජයරත්න හිමිකම් කියන අඹගහකනත්ත හෙවත් දෙල්ගහවත්ත ; |
| *නැගෙනහිරට* | : | ශ්‍රියාලතා ජයරත්න හිමිකම් කියන අඹගහකනත්ත හෙවත් දෙල්ගහවත්ත සහ කාණුව ; |
| *දකුණට* | : | කාණුව සහ ජේ. පී. ගංගොඩවිල හිමිකම් කියන අඹගහකනත්ත ; |
| *බටහිරට* | : | ජේ. පී. ගංගොඩවිල හිමිකම් කියන අඹගහකනත්ත සහ මාර්ගය. |

කැබලි අංක N

| | | |
|---|---|---|
| *උතුරට* | : | සන්ධ්‍යා රන්වත්ත හිමිකම් කියන වස්කඩුවවත්ත සහ හිමිකරු සොයාගත නොහැකි වස්කඩුවත්ත ; |
| *නැගෙනහිරට* | : | හිමිකරු සොයාගත නොහැකි වස්කඩුවවත්ත සහ ජේ. සුනිල් සහ තවත් අය හිමිකම් කියන වස්කඩුවවත්ත ; |
| *දකුණට* | : | ජේ. සුනිල් සහ තවත් අය හිමිකම් කියන වස්කඩුවවත්ත සහ මාර්ගය ; |
| *බටහිරට* | : | මාර්ගය සහ සන්ධ්‍යා රන්වත්ත හිමිකම් කියන වස්කඩුවවත්ත. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.